# Abstract 10

# බෞද්ධ මනෝ චිකිත්සක ක්‍රම පිළිබඳ අධ්‍යයනයක්

**ජේ. ඒ. එස්. එස්. ජයකොඩි,**
(ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) තෙවන වසර)
*sagarajayakodi92@gmail.com*

මෙම පර්යේෂණ පත්‍රිකාව බෞද්ධ මනෝවිද්‍යා විෂය පථයට අදාළ අධ්‍යයනයක් වන අතර මූලික වශයෙන් මූලාශ්‍රය පදනම් කරගත් පර්යේෂණ පැතිකඩට අයත් වන්නකි. බෞද්ධ මනෝවිද්‍යාව මනස මූලික කොටගත් ව්‍යාධි සන්සිඳවීමට අවැසි උපදෙස් දීර්ඝ කාලයක් තිස්සේ මානව සමාජයට ලබාදුන් අතර අද්‍යතන සංකීර්ණ සමාජ ව්‍යූහයට ද එය ශාස්ත්‍රීය හැදෑරීම් ක්‍රමවේදයක් ඔස්සේ උපදේශන ක්‍රියාවලියක් සපයයි. බුදුදහම තුළ දාර්ශනික වශයෙන් එන එම මනෝ විශ්ලේෂණවාදය උපයුක්ත කරගනිමින් වර්තමාන සමාජය ප්‍රධාන වශයෙන් මුහුණ පා තිබෙන ආතති, ක්ලමථ, චිත්තවේග පාලනය කිරීම විෂයයෙහි බෞද්ධ **මනෝ චිකිත්සක** ක්‍රමය ඵලදායී ලෙස උපයෝගී කරගැනීමේ ක්‍රමවේද සාකච්ඡා කිරීම මෙයින් අපේක්ෂා කෙරේ. මේ සඳහා බටහිර මනෝවිද්‍යාවෙහි මනෝ රෝග නිවාරණයට අනුගමනය කෙරෙන ක්‍රමවේද හා භාවිත ද සාකච්ඡා කිරීම වඩාත් ඵලදායක වනු ඇත. බටහිර මනෝවිද්‍යාවෙහි ගොඩනැඟී ඇති මනෝ චිකිත්සක මූලධර්මවලට සාපේක්ෂකව ගොඩ නැගිය හැකි බෞද්ධ මනෝ චිකිත්සක මූලධර්ම බුදුන් වහන්සේගේ ඉැගැන්වීම් පාදක කරගනිමින් හඳුනා ගැනීමට වෑයම් කිරීමත් ඊට බටහිර චිකිත්සක ක්‍රමයෙහි ඖෂධ වර්ග භාවිත කරන්නාක් මෙන් බෞද්ධ දාර්ශනික හා සංස්කෘතික චරණයන්හි අවශේෂ භාවිත **ව්‍යතිරේක** වශයෙන් අදාළ කරගැනීමේ හැකියාව හා යුක්තිය පිරික්සීමත් මෙහි අපේක්ෂිත කාර්යය වේ.

**ප්‍රමුඛ පද :** බුදුදහම, මනෝ චිකිත්සාව, මනෝ රෝග, මනෝවිද්‍යාව, ව්‍යතිරේක